239


ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகரிஸ் மாவத்தை, கொழும்பு 07.
No 07, Gregory's Avenue, Clombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax — 2684051
ඊමේල් / ஈ-மெயில் / E-mail — Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல. / MY NO — 5/2/6/2008,
ඔබේ අංකය / உமது இல. / YOUR NO — 3\1
දිනය / திகதி / DATE — 2008.04.3

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
03 APR 2008

චක්‍ර ලේඛ අංක- 2008/2

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත.

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍රවල අනුප්‍රාප්තිය නම් කිරීම හා අවලංගු කිරීම.

## ඉ.කො.155 ආකෘති ලියාපදිංචි කිරීම.

ඉහත කරුණ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සියලු ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් ඇමතූ ප්‍ර/නො01/19/ඉ.ස/ චක්‍ර 2008 සහ 2008.02.08 උපදෙස් ලිපියේ පිටපතක් මේ සමඟ එවමි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර වල අනුප්‍රාප්තිය නම් කිරීමේදී අදාල ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ නොකර ලියාපදිංචි කිරීම නිසා එවැනි ලේඛන වෙනස් කරමින් නම් කරන ලද පසු උරුම කරුවන් වෙනස් කිරීමේ සිදුවීම් කීපයක් දිවයිනේ ස්ථාන කීපයකින් වාර්තා වී ඇත. මේ මගින් මියගිය ප්‍රදාන පත්‍ර ලාභීන්ගේ අවසාන කැමැත්ත ඒ ආකාරයෙන් ඉටු නොවන නිසා එවැනි තත්ත්වයක් ඇති වීම වැලැක්වීමට පියවර ගත යුතුව ඇත. දැනට කෙරෙන පරීක්ෂණ අනුව මෙවැනි කූට ලේඛන සකස් වී ඇත්තේ ඉ.කො.155 ආකෘතිය සම්පූර්ණ කිරීමේදී දී ඇති උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමයි. එබැවින් ඉ.කො.155 ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කරවීම සම්බන්ධව සියලු පාර්ශව දැනුවත් කිරීමටත් මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. නිසි පරිදි සම්පූර්ණ නොකරන ඉ.කො.155 ආකෘති ඉදිරියේදී ලියාපදිංචි නොකර ප්‍රතික්ෂේප කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් කටයුතු කරනු ඇත.

### ඉ.කො.155 ලේඛන සහතික කිරීමට බලය ලත් තැනැත්තන්.

මෙම ලේඛන සහතික කිරීමට ඉඩම් සංවර්ධන ආඥාපනතේ 56 (1) වගන්තිය යටතේ පහත තනතුරු දරන්නන් වෙත බලතල ලබාදී ඇත.

- ❖ දිසාපති වරයා
- ❖ ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා
- ❖ ප්‍රාදේශීය සහකාර දිසාපති වරයා / ප්‍රාදේශීය ආදායම් නිලධාරී.
- ❖ ප්‍රසිද්ධ නොතාරිස්
- ❖ සමාදාන විනිශ්චයකාරවරයා

## ඉ.කො.155 ලේඛනය සම්පූර්ණ කිරීම.

**ඉ.කො.155 ආකෘති පත්‍රය ප්‍රධාන කොටස් 4 කින් සමන්විතය.**

(i) පළමු පිටුව - ප්‍රදාන පත්‍ර කරුගේ ප්‍රකාශය .
(ii) දෙවන පිටුව - ප්‍රදාන පත්‍ර කරුගේ ප්‍රකාශය සහතික කිරීම .
(iii) තුන්වන පිටුව - අනුප්‍රාප්තිකයන් ලෙස නම් කළ අයගේ විස්තර හා එක් එක් අය පත් කළ ඉඩමේ කොටස් පිළිබඳ විස්තර .
(iv) හතරවන පිටුව - නම් කිරීමකට අදාල නීතිමය උපදෙස් .

දැනට ක්‍රියාත්මක වන ආකාරය අනුව බොහෝ විට සිදුවන්නේ ඉ.කො.155 ආකෘතියේ දෙවන පිටුවේ ප්‍රකාශකයගේ අත්සන සහතික කිරීම එක් අයෙකුත් තුන්වන පිටුවේ එසේ නම් කරන කරුණු සහතික කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන බවය. මෙහිදී එක් එක් කොටසේ නම් කිරීම පිළිබඳව සාමූහික වගකීමක් නොමැති බැවින් එම ලේඛනය වෙනස් කළ අවස්ථාවක සහතික කරන අය වගකීමෙන් නිදහස් වීමට උත්සාහ දරණ බව පෙනේ. <u>මේ නිසා මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් සහතික කරන විට දෙවන පිටුව හා තුන්වන පිටුව යන ස්ථාන දෙකම එකම නිලධාරියෙකු විසින් සහතික කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙමි.</u>

ඇතැම් විට ප්‍රදාන ලාභී විසින් දෙවන පිටුව වෙනත් අයෙකු ලවා සහතික කරවා ගෙන තුන්වෙනි පිටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නම් කරවා ගැනීමට උත්සාහ ගන්නේ එහි නීත්‍යානුකූල තත්ත්වය ආරක්ෂා වන ආකාරයට නම් කිරීමට විය හැකිය. එවැනි විටක අවශ්‍ය උපදෙස් ලබාදී දෙවන පිටුව සහතික කළ අය ලවාම තුන්වන පිටුව සහතික කරවා ගැනීමට උපදෙස් දීම මැනවි.

### <u>ඉ.කො. 155 ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේදී පහත කරුණු ගැනද නිසි අවධානය යොමු වීම අවශ්‍ය ය.</u>

(1) අනුප්‍රාප්තිකයා නම් කරනු ලබන ඉ.කො. 155 ආකෘති පත්‍රයේ 3 වන පිටුවේ අංක 2,3,4, තීරු නිසි පරිදි සම්පූර්ණ කිරීම අවශ්‍යය.

(11) අනුප්‍රාප්තිකයන් නම් කරනු ලබන්නේ එක් අයෙක් නම් සම්පූර්ණ ඉඩම සඳහා නම් කිරීම කළ යුතුය. එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් නම් කරන්නේ නම් එක් එක් අයට හිමි කොටස පැහැදිලිව දැක්විය යුතුය. ඒ සඳහා මැනුම් පිඹුරක් ඇත්නම් එම කොටස එකී පිඹුර ඇසුරින් පැහැදිලි කිරීමද සුදුසුය. එවැනි අවස්ථාවක කොටස් සියල්ලේ එකතුව ප්‍රදාන පත්‍රයේ මුළු ඉඩමේ ප්‍රමාණයට සමාන විය යුතුය.

111) සහතික කරන්නා විසින් නම් කිරීමකින් පසුව වෙනත් නම් ඇතුලත් කළ නොහැකි වනසේ Z හැඩයෙන් ඉරක් ගසා එම තීරු වසා දැමිය යුතු අතර එම ඉරට යටින් නවත් අත්සනක් තැබිය යුතුය. <u>මේ අනුව 3වන පිටුවේ සහතික කරන්නාගේ අත්සන් දෙකක් තිබීම අනිවාර්යය.</u>

(1v) සහතික කරන්නාගේ අත්සනට යටින් නිල මුද්‍රාව තිබිය යුතුය.

(7)

## ඉ.කො.155 ලේඛන ලියාපදිංචියට යැවීම.

ලේඛන සහතික කරන තැනැත්තන් අතරින් නොතාරිස් වරුන් ප්‍රාදේශීය ලේකම් වරුන් සහ රෙජිස්ට්‍රාර්වරුන් සහතික කළ ලේඛන භාර ගැනීමට ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් ක්‍රියා කරන නමුත් ප්‍රමාදාන විනිශ්චයකාර වරයෙකු සහතික කරන ලේඛන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට භාර ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල වී නැති නිසා එවැනි ලේඛන තව දුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාරගෙන ලියාපදිංචිය සඳහා යැවීමට සිදුවේ.

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 60 වන වගන්තිය අනුව අනුප්‍රාප්තිය නම් කිරීමේ ලේඛනයක් ප්‍රදාන කරුගේ මරණයට කලින් විධිවූ පරිදි ලියාපදිංචි නොකොළොත් එම නම් කිරීම හෝ අවලංගු කිරීම බල රහිත වේ. මේ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර ගන්නා ඉ.කො. 155 ලේඛන පරිපාලනමය ප්‍රමාදයන්ගෙන් තොරව ඉක්මනින් ලියාපදිංචි කිරීමට වැඩ පිළිවෙලක් යොදනමෙන් ඉල්ලා සිටිමි. මෙය ඉතා වැදගත් අවශ්‍යතාවයක් බවද සිහිපත් කිරීමට කැමැත්තෙමි.

### වෙනත් කරුණු.

- අනුප්‍රාප්තියක් නම් කිරීම හෝ අවලංගු කිරීම සහතික කර ලියාපදිංචි කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පමණක් ඉටු නොවන නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් යම් නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් සහතික කිරීමට පෙර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් පත් ඉරුවේ උධෘතයක් ලබාගෙන පරීක්ෂා කිරීම අත්‍යාවශ්‍යය.
- ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධි විධාන උල්ලංඝනය වන පරිදි යම් නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් ලියාපදිංචි වී ඇති බවට ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවක එම ඉඩම සඳහා නීත්‍යානුකූලව පසු උරුමය නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් නොමැතිසේ සලකා අලුත් නම් කිරීමක් හෝ අවලංගු කිරීමක් සහතික කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හැකියාව තිබේ.
- කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්

1 රෙජිස්ට්‍රාර් ජනරාල්
2 සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන්
3 සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් } දැ.ගැ.ස.

4 සියළුම නියෝජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස් වරුන් , අන්තර් පළාත්. — මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කරන්න.